# <u>සුභාෂිතය</u>

**විෂයය** : සිංහල භාෂාව හා සාහිත්‍යය

**ශ්‍රේණිය** : 11

**වාරය** : තුන්වන වාරය

**නිපුණතාව** : **9.0** සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : **9.2** පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි.

**ඉගෙනුම් පල** :
- සාහිත්‍ය නිර්මාණවල ප්‍රකට වන යහ සිරිත් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- යහසිරිත් අනුගමනය කිරීම අගය කරයි.
- පොත පතින් හඳුනා ගත් යහසිරිත් අනුගමනය කරයි.

## <u>ක්‍රියාකාරකම් 1</u>

1) උපදේශාත්මක කාව්‍යය යනු කුමක් දැයි කෙටියෙන් දක්වන්න.
2) උපදෙස් සැපයූ උපදේශ කාව්‍ය ග්‍රන්ථ නම් කරන්න.
3) සුභාෂිතය කතුවරයා නම් කරන්න.
4) වීදාගම මෛත්‍රේය හිමියන්ගේ නිර්මාණ කිහිපයක් ලියන්න.
5) අලගියවන්න මුකවෙටිතුමා රචනා කරන ලද වෙනත් නිර්මාණ කිහිපයක් නම් කරන්න.
6) සුභාෂිතය රචනා කිරීම සඳහා රචකයා අරමුණු කළේ කුමක් ද ?
7) සුභාෂිතය රචනය සඳහා කවියා යොදා ගත් මූලාශ්‍ර ග්‍රන්ථ නම් කරන්න.
8) සුභාෂිතය කාව්‍ය ග්‍රන්ථයේ අන්තර්ගත ලක්ෂණ පෙන්වා දෙන්න.
9) සුභාෂිතයට පාදක කර ගත් විරිත කුමක් ද ?
10) සුභාෂිතය රසවත් කර ගැනීමට යොදා ගෙන ඇති කාව්‍ය උපක්‍රම ලියා දක්වන්න.

## ක්‍රියාකාරකම් 2

1) පහත ‘අ’ කොටසේ ඇති කවි පාදයට ගැළපෙන අදහස ‘ආ’ කොටසින් තෝරා යා කරන්න.

| (අ) | (ආ) |
|---|---|
| i. එක පැහැයෙන් ඉදිතත් කොවුලනට | A. අහංකාර නො වී සිරිත් පරිදි ජීවත් වෙයි. |
| ii. පසක් දුදන පබු කන මුව ළං කළ ද | B. නුවණැත්තෝ මුළු ලෝකයෙහි සම්පත් සියල්ල |
| iii. මත වරණිදුට පෙදෙනැන වෙහෙසෙන අයුර | C. කෝකිලයන් හට පැහැයෙන් සමානව සිටියත් |
| iv. ලදුවත් නැණැති දන මුළු ලොව ඉසුරු රැස | D. දුදනකු කේලාම් කීමට අධිපතියාගේ කනට මුව ළං කළොත් |
| v. ගොරතර නිරෙහි වත් පරනට වැඩ ඇති ද | E. මත් ඇත් රජෙකුට පයින් ඇන වෙහෙස ගන්නාක් වැන්න. |
| vi. සිරිත් ලෙසට පවතී උඩඟු නොවමින | F. අනුන් හට වැඩක් සැලසේ නම් අතිශය ඝෝරවූ නරකාදියෙහි |

## ක්‍රියාකාරකම් 3

1) පද්‍ය පන්තියෙන් සමාජයට ගත හැකි ආදර්ශ කිහිපයක් ලියා දක්වන්න.

2) සුභාෂිතය රසවත් කළ උපමාලංකාර 3ක් ලියා දක්වන්න.

3) සුභාෂිතය රසවත් කිරීමට කවියා සත්ත්ව චරිත යොදා ගෙන ඇති අවස්ථා මොනවා ද ?

4) වෙනත් කෘතිවල උපදේශාත්මක කවි දෙකක් ලියන්න.

5) පහත වචනවල අරුත් ලියන්න.

i. තෙද බලැති -
ii. රිටුන් -
iii. සිඳු -
iv. තිරසර -
v. සුදනෝ -
vi. නිරය -
vii. තුමුල -
viii. වරණිඳු -
ix. ඉසුරු -
x. නිසිදේ -
xi. පවර -
xii. අමරස -
xiii. සපෙක් -
xiv. උඩඟු -
xv. නොමඬින -

6) ‘‘සුභාෂිතයෙන් කියවෙන උතුමන්ගේ ජීවිත’’ මැයෙන් රචනයක් ලියන්න.

**<u>පිළිතුරු</u>**

## <u>ක්‍රියාකාරකම 1</u>

1) පුද්ගලයින් තුළ සුදන ගුණ යහ ගුණ වර්ධනය කිරීම පිණිස ලියූ කාව්‍ය ග්‍රන්ථ
2) 
   - ලෝවැඩ සඟරාව
   - ලෝකෝපකාරය
   - සිරිත් මල්දම
3) අලගියවන්න මුකවෙටිතුමා
4) 
   - ලෝවැඩ සඟරාව
   - බුදුගුණාලංකාරය
   - දහම්ගැටමාලාව
5) 
   - සැවුල් සන්දේශය
   - කුස ජාතක කාව්‍ය
6) සීතාවක යුගය දේශපාලන මෙන් ම සමාජාර්ථික පරිහාණි කාලයක් නිසා සමාජයට සාරධර්ම කියාදීමට
7) 
   - පාලි ධම්ම පදය
   - දෙමළ උපදේශ ග්‍රන්ථ
   - තිරුක්කුරළ්
   - නාලඩියාර්
   - පංච තන්ත්‍රය
   - හිතෝපදේශය
8) 
   - ජීවන දර්ශනය දෘෂ්ටාන්ත උපමා මගින් සනාථ කර ඇත.
   - පළමු දෙපදයෙන් දැක්වෙන කරුණු ඊළඟ පාද දෙකේ උපමාවෙන් විස්තර වේ.
9) සමුද්‍රඝෝෂ විරිත
10) 
   - උපමාලංකාර
   - අනුප්‍රාස
   - එළිසමය

## <u>ක්‍රියාකාරකම 2</u>

1) .
   - i. C
   - ii. D
   - iii. E
   - iv. B
   - v. F
   - vi. A

## ක්‍රියාකාරකම 3

1) ● සමාජයක් ම විනාශ වන කේලාම් කීම සත්පුරුෂයන්ට තරම් නොවන බව
● උතුම් අයට වෛර බැඳීමට යාම නිෂ්ඵල දෙයක් බව
● සත්පුරුෂයන්ට කෙතරම් සැප සම්පත් ලැබුණත් අහංකාර නොවේ.
● මුළු ලෝකයේ ම සැප සම්පත් ලැබුණත් තමන්ට තරම් දේ මිස නො ගැළපෙන දේ නොකරන බව

2) ● ජලය ගලා ආවත් ගැඹුරු සයුර වෙරළ ඉක්මවා නොයන්නා සේ
● හස්තිරාජයා කලබලයට පත්වූව තම හොඬවැල නො පාගන්නාක් මෙන්
● පර්වත දළ අගින් පහර දෙන මත් ඇතෙකුට පයින් ඇන වෙහෙස ගන්නාක් මෙන්

3) ● උතුම් මිනිසුන්ගේ තේජස පිළිබඳ ව කියා පෑමට හස්ති රාජයෙකු සම්බන්ධ කිරීම.
● කෝකිලයන් හා කපුටන් නාදයෙන් දැනගන්නා අවස්ථා
● මත් වූ හස්තියා හොඬවැල නො පාගා ගන්නා අවස්ථාව
● සර්පයෙක් දෂ්ට කිරීම.

4) .

අසල් ගෙයක සොරකම් ගිය දවසෙ ක
කුහුල් සිතින් ඉන්නේ තමගේ රැක
සියල් සතුන් මරුගෙන යනු දැක දැක
කුසල් නොකර ඉඳිනේ ඇයි නොවසැක
- ***ලෝවැඩ සඟරාව***

බොරු කීම කැතම ය
ගැරඬි කුණටත් නො සම ය
ඇත්ත නම් කදිම ය
මෙලොව රජ සැපතටත් උතුම ය
- ***සිරිත් මල්දම***

5) .

i. තේජස් බලය
ii. කපුටන්
iii. සාගරය
iv. ස්ථිරසාර
v. යහපත් ජන
vi. අපාය
vii. මහත්
viii. හස්ති රාජයා
ix. සම්පත්
x. සුදුසු දේ
xi. උතුම්
xii. අමෘත රස (අමා රස)
xiii. සර්පයෙක්
xiv. ආඩම්බර
xv. නො පාගන

6) .

- පාඩම ආශ්‍රිත කවිවල අර්ථ ගෙන උතුමන්ගේ ජීවිතවල ස්වභාවය පෙන්වා දීම.
- කවි ආශ්‍රිත ව උදාහරණ ලබා ගන්න.
- හැඳින්වීම
- ඡේද තුනක් පමණ කාලීන වශයෙන් තොරතුරු ගෙන රචනාව පෙළ ගස්වන්න.